"ශ්‍රේෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු" (96)

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE


204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන /தொலைபேசி/ Telephone - 0112 - 2092599
ෆැක්ස් /பெக்ஸ்/ Fax - 0112 - 2092601
ඊ-මේල් /மின்னஞ்சல்/ E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 0112 - 2093000


SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2021/03/ 8

**පාලන චක්‍රලේඛ - 03/2021**

ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රධාන නීති නිලධාරි,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම්,

**<u>බාහිර පාර්ශවයන් සමඟ ගිවිසුම් ගත වීම.</u>**

පළාත් සභාව සතු විවිධ ආයතන පොදු එකඟතාවයකින් තොරව යම් යම් කාරණා සම්බන්ධයෙන් විවිධ බාහිර ආයතන සමඟ ගිවිසුම් ගත වන බවත්, එමගින් පළාත් සභාව වශයෙන් යම් යම් දුෂ්කරතාවන්ට මේ වන විට මුහුණ දීමට සිදුවන බැව් අවස්ථා කිහිපයකදී නිරීක්ෂණය වී ඇත.

02. එබැවින් පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ ව්‍යවස්ථාපිත ආයතන තම ආයතන සතුව පවතින උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා සේවාවන් සපයා ගැනීම හෝ ගොඩනැගිලි වල නිරතුරු කල යුතු සේවාවන් ඉටු කරවීම වෙනුවෙන් බාහිර පාර්ශව සමඟ ඇති කර ගන්නා ගිවිසුම් හැර දේශීය විදේශීය රාජ්‍ය හා රාජ්‍ය අනුබද්ධ ආයතන, බහු ජාතික සමාගමක් හෝ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත්ව වෙනත් ඕනෑම ආයතනයක් සමඟ ගිවිසුම් ගතවීමකදී ඊට පෙර අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග පහත ආකාරයට හඳුන්වා දෙනු ලැබේ.

- ගිවිසුම්ගත වීමට අදාළ ප්‍රස්තුත කාරණය සම්බන්ධ පැහැදිලි ව්‍යාපෘති වාර්තාවක්, වැඩ සටහනක් හෝ යෝජනාවක් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය.
- එසේ අනුමැතිය ලත් ව්‍යාපෘතිය හෝ සේවා ව ලබා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය යම් ආයතනයක් සමඟ ගිවිසුම් ගත වීමක් කල යුතු වන්නේ නම් එම ගිවිසුමෙහි කෙටුම්පතක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතුය.
- ගිවිසුම් ගත වීම සඳහා යම් ආයතනයක් සඳහා එකඟතාවයන්ට පැමිණීමේදී පළාත් සභාවට අගතියක්, පාඩුවක් හෝ අපකීර්තියක් ඇතිවන හෝ ඇතිවේ යයි උපකල්පනය වන කිසිදු කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් නොකල යුතුය.
- පළාත් අමාත්‍යාංශයක් නොවන දෙපාර්තමේන්තුවක්, ආයතනයක් හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් මෙබඳු ව්‍යාපෘතියක් කිරීම සඳහා යෝජනාවක් හෝ ගිවිසුම් කෙටුම්පතක් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේදී අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ද සමඟ ඉදිරිපත් කල යුතුය.

03. ඒ අනුව මින් ඉදිරියට එවැනි යම් කටයුත්තක් සඳහා ගිවිසුම්ගත වීමකදී ඉහත උපදෙස් අනුගමනය කිරීමට වග බලා ගන්නා ලෙස මෙයින් උපදෙස් දෙමි.

O/C

ජේ.එම්.සී ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.